**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩත්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No 6/5, Layards Road, Colombo 05, **Tel:** 011 3010664,011 2081384/6 Ext 123
**Fax**: 011 2081388 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

මෛත්‍රීපාල සිරිසේන මහතා,
ගරු ජනාධිපති,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

2017-09-25

ගරු ජනාධිපතිතුමනි,

**පළාත් සභා කොට්ඨාස සීමා නිර්ණය සඳහා ජාතික සීමා නිර්ණය කොමිෂන් සභාවේ සහාය ලබාගන්නා ලෙස ඉල්ලා සිටීම**

ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාළාත් සභා ඡන්ද විමසීම් නව මැතිවරණ ක්‍රමයක් යටතේ පැවැත්වීමට හා නාම යෝජනා ලැයිස්තු තුළ කාන්තා නියෝජනය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් පසුගියදා පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද පළාත් සභා සංශෝධන පනතට අදාළව ඉතා වැදගත් කරුණු කිහිපයක් පිළිබඳව ඔබතුමන්ගේ අවධානය යොමු කරන්නෙමු.

එකී සංශෝධන පනත හඳුන්වාදීම සඳහා අරමුණු කර ගන්නා ලද කරුණු කෙරෙහි මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස අප තුළ ප්‍රසාදයක් ඇති බව ප්‍රථමයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමු. එසේ වුවද එය සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුව එතෙක් කලක් අනුදත් සම්ප්‍රදායන් බැහැර කරන ලද බව අප නිරීක්ෂණය කළෙමු. ඒ අනුව එකී ක්‍රියාදාමය පිළිබඳව අප තුළ ඇත්තේ නොපහන් බවක් බවද ඔබතුමන් වෙත කාරුණිකව දැනුම්දෙන්නෙමු.

තවද එකී සංශෝධන පනත මේ වන විටත් සම්මතව පවතින බැවින් එහිලා අතිශය වැදගත් වන්නා වූ කරුණක් පිළිබඳව ඔබතුමන්ගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමු. එනම් සීමා නිර්ණය කමිටුවක් පත් කිරීමයි. ඉහත පනතේ කැපී පෙනෙන ප්‍රතිපාදනයක් වන්නේ පළාත් සභා ඡන්ද කොට්ඨාස හඳුනා ගැනීම හා නිර්ණය කිරීම සඳහා සීමා නිර්ණය කමිටුවක් පත් කිරීමයි. ඒ අනුව එකී කමිටුව සඳහා දැනටමත් මෙරටේ ව්‍යවස්ථාපිතව පිහිටුවා ඇති සීමා නිර්ණය කොමිෂන් සභාව සහ එහි සමාජිකයන්ගේ සේවය ලබා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටින්නෙමු. මෙරටේ සීමා නිර්ණය කටයුතු පිළිබඳව ප්‍රමාණික අවබෝධයකින් යුත් එකී කාර්යය සඳහා ම පිහිටුවා ඇති කොමිෂන් සභාවේ සේවය ලබා නොගෙන වෙනත් කමිටු පත් කිරීම තුළින් සිදුවන්නේ අදාළ කාර්යය නිසි ලෙස ඉටු නොවීම බව අප ආයතනයේ නිරීක්ෂණයයි.

ඊට කදිම නිදසුන වන්නේ පළාත් පාලන ඡන්ද විමසීමට අදාළව මෙතෙක් පත් කරන ලද සීමා නිර්ණය කමිටුව සහ එහි වාර්තාව සමාලෝචනය සඳහා පත්කරන ලද කමිටුව යන දෙකෙහි ක්‍රියා කලාපයයි. එකී කමිටු තම කාර්යය නිම කිරීම සඳහා ගන්නා ලද කාලය අසාමාන්‍ය වූ අතර ඊට අදාළ අනෙකුත් තාක්ෂණික ගැටළුද විමසීමේදී පැහැදිලි වන්නේ එවන් කමිටු පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යය ඉටු කර ගැනීම දුෂ්කර බවයි.

තවද මැතිවරණ කල් දැමීම සඳහා එකී කමිටු උපයෝගීකර ගන්නේයැයි යන මතයක් ද සමාජගතව ඇත. ඊට අමතරව අනාගත මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකදී වඩාත් තීරණාත්මක කාර්යභාරයක් සිදුකළ හැකි යාන්ත්‍රණයක් වන්නේ සීමා නිර්ණය කොමිෂන් සභාවයි. කවර අංශයෙන් සැළකුව ද එහි සේවය ලබා ගැනීම වැඩදායක බව ඔබතුමන් වෙත සිහිකරන්නට කැමැත්තෙමු.

ඉහත කරුණ පිළිබඳව ඔබතුමන් දක්වන සහයෝගය ඉතා අගය කොට සළකන්නෙමු.

ස්තුතියි,

මංජුල ගජනායක,
ජාතික සම්බන්ධීකාරක

පිටපත් : රනිල් වික්‍රමසිංහ මහතා, ගරු අග්‍රාමාත්‍ය.

කරු ජයසූරිය මහතා, ගරු කථානායක.

ආර්. සම්බන්ධන් මහතා, ගරු විපක්ෂ නායක.

ෆයිසර් මුස්තාෆා මහතා, පළාත් පාලන සහ පළාත් සභා ගරු අමාත්‍ය.

මහින්ද දේශප්‍රිය මහතා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව.

කේ. තවලිංගම් මහතා, සභාපති, සීමා නිර්ණය කොමිෂන් සභාව.

කමල් පත්මසිරි මහතා, ලේකම්, පළාත් පාලන සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ

පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවල නායක නායිකාවන්.

(මෙම ලිපියට අන්තර්ගත කරන ලද ඉල්ලීමෙහි පවත්නා වැදගත්කම සළකා මෙම ලිපිය මාධ්‍ය වෙත යොමු කරන බවද ඉතා කාරුණිකව සිහි කරන්නෙමු).